Epidemiology Unit

Ministry of Health

National Immunization Programme

Love Protection

# වසංගත රෝග විද්‍යා අංශය

**සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යංශය**

**231, ද සේරම් පෙදෙස, කොළඹ 10.**

දුර: (+94 11) 2695112, 4740490, 4740491, 4740492 , 2681548 ෆැක්ස්: (+94 11) 2696583 ඊ මේල්: chepid@sltnet.lk, epidunit@sltnet.lk වෙබ්· www.epid.gov.lk


## නව කොරෝනා වෛරස් ආසාදනය (COVID-19) දෛනික වාර්තාව 2020.02.23 පෙ.ව. 10

- හේතුවක් නිශ්චිතව හඳුනා නොගත් නියුමෝනියා වසංගත රෝග තත්වයක් මුල්වරට 2019 දෙසැම්බර් 31 වන දින චීනයේ හුබෙයි පළාතේ වුහාන් නගරයෙන් වාර්තා විය. 2020 ජනවාරි 07 වන දින එම වසංගත තත්වයට හේතුව නව කොරෝනා වෛරසය බව මුල්වරට හඳුනා ගන්නා ලදී. 2020 ජනවාරි 30 දින ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් මෙම රෝගයේ ව්‍යාප්තිය සලකා ගෝලීය මහජන සෞඛ්‍ය හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරන ලද අතර 2020 පෙබරවාරි 11 දින රෝගයේ කෙටි යෙදුම ලෙස "COVID-19" හඳුන්වා දෙන ලදි.
- මෙම රෝගයේ බීජෞෂණ කාලය (විෂබීජය ශරීරගත වූ දින සිට රෝග ලක්ෂණ පහළ වීම දක්වා ගතවන කාලය) දින 2 - 14 දක්වා බව දනට තිබෙන දත්ත අනුව පැහැදිලි වේ.
- දනට මහජනතාව හෝ දරුවන් විසින් මුඛ ආවරණ පැළඳීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය මගින් නිර්දේශ කර නොමැත.

### ශ්‍රී ලංකාවේ තත්වය

- තහවුරු කරන ලද රෝගියා 19.02.2020 දින සුවය ලබා රෝහලෙන් පිටව ගියාය.
- දැනට රෝහල් ගත කර වෛද්‍ය අධීක්ෂණය යටතේ සිටින පුද්ගලයින් - 4

| රෝහල | මේ දක්වා එකතුව | | | අද දින උදේ 10 ට | | |
|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලාංකික | විදේශික | එකතුව | ශ්‍රී ලාංකික | විදේශික | එකතුව |
| ජාතික බෝවන රෝග විද්‍යායතනය | 81 | 51 | 132 | 1 | 2 | 3 |
| ජාතික රෝහල | 8 | 1 | 9 | 0 | 0 | 0 |
| ශික්ෂණ රෝහල - රාගම | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| ශික්ෂණ රෝහල - කරාපිටිය | 11 | 5 | 16 | 0 | 0 | 0 |
| ශික්ෂණ රෝහල - අනුරාධපුර | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| ශික්ෂණ රෝහල - කුරුණෑගල | 8 | 0 | 8 | 1 | 0 | 1 |
| ශික්ෂණ රෝහල - යාපනය | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| නුවර ජාතික රෝහල | 15 | 0 | 15 | 0 | 0 | 0 |
| ශික්ෂණ රෝහල - මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| දි. මූ. - ගම්පහ | 8 | 0 | 8 | 0 | 0 | 0 |
| දි. මූ. රෝහල - මීගමුව | 12 | 2 | 14 | 0 | 0 | 0 |
| ශික්ෂණ රෝහල- රත්නපුර | 5 | 0 | 5 | 0 | 0 | 0 |
| පළාත් මහ රෝහල - බදුල්ල | 1 | 0 | 1 | 0 | 0 | 0 |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ද සොයිසා කාන්තා රෝහල | 0 | 0 | 0 | 0 | 0 | 0 |

- මූලාශ්‍රය - වසංගත රෝග විද්‍යා අංශය-රෝග ආවේක්ෂණ පද්ධතිය

### ලෝක තත්වය

- පරීක්ෂණවලින් තහවුරු කරන ලද රෝගීන් 77794 (76392 චීනයෙන් - 1402 වෙනත් රටවල් වලින්)
- ආසාදිත රෝගීන් රටවල් 28 කින්
- මරණ 2359 (2348 චීනය, 1 පිලිපීනය, 1 ජපානය, 1 ප්‍රංශය, 2 කොරියාව, 4 ඉරානය, 2 නිරෝධායිත නැව)

  -ලෝක සෞඛ්‍ය සංවිධානයේ දිනපතා වාර්තාව 22/02/2020







### රෝගය වැළැක්වීම සඳහා

1. **නිතර සබන් දමා අත් සේදීම.**
2. උණ, සෙම්ප්‍රතිශ්‍යාව රෝග වලින් පෙළෙන රෝගීන් සමග සමීප සම්බන්ධතාවයන් ගෙන් වැළකීම.
3. සජීවී හෝ මළ සතුන් ඇල්ලීමෙන් වැළකීම.
4. නිතර නාසය, ඇස සහ මුඛය ඇල්ලීමෙන් වැළකීම.
5. කිඹුහුන් යනවිට සහ කහින විට පාවිච්චි කර ඉවත්කරන ටිෂූ භාවිතා කිරීම හෝ වැලමිට භාවිතා කිරීම.
6. ජනතාව බහුලව ගැවසෙන ස්ථානවලට යැමෙන් හැකිතාක් වළකින්න.